ලංකාවට Online

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

(නව විෂය නිර්දේශය)

**ii පත්‍රය**

ඒකකය - 06

## මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය විචාරය

නව ප්‍රශ්න සැකසුම - **සංජීව ක්‍රිෂාන්ත රණසිංහ**

කාලය පැය තුනයි.

**1)**

i. මාධ්‍ය සාක්ෂරතාවය යන්න **ජේම්ස් පෝටර්ට** අනුව හඳුන්වන්න. (ල.02)

ii. මාධ්‍ය සාක්‍ෂරතාව දෙස විවිධ **පර්යාලෝක** වලින් බැලීමේදී සෞන්දර්ය මානය හා සදාචාරාත්මක මානය යන්න වෙන වෙනම පැහැදිලි කරන්න. (ල.04)

iii. **මාධ්‍ය හා සංස්කෘතිය** යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.06)

iv. **මාධ්‍ය හා මායාව** යන්න වර්තමාන මාධ්‍ය ඇසුරෙන් උදාහරණ ගෙන සඟරාවකට ලිපියක් ලියන්න. (වචන 150කට නොඅඩු) (ල.08)

**2)**

i. මාධ්‍ය සාක්ෂරතාව යන්න ඇමරිකාවේ මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ ජාතික ආයතනයේ **නිර්වචනය** දක්වන්න. (ල.02)

ii. සංදේශයක් තුළ ඇතුළත් **තොරතුරු වර්ග** දෙක දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.04)

iii. සංදේශයක **පෙළ** සහ **උප පෙළ** යන්න වෙන වෙනම හඳුන්වන්න. (ල.06)

iv. මාධ්‍ය සංදේශ ගොඩනැගීමේදී ශූර මෙහෙයවීම, මාධ්‍ය ඒකාකෘතික බව යන්න වර්තමාන උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ල.08)

**3)**

i. සාක්ෂරතාවය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.02)

ii. මාධ්‍ය අභිප්‍රේරණය හා විකෘතිකරණය යන්න වෙන වෙනම පැහැදිලි කරන්නන. (ල.04)

iii. **නව මාධ්‍ය** පරිශීලනයේදී හා **විකල්ප මාධ්‍ය** භාවිතයේදී මාධ්‍ය විචාරය වැදගත් වන්නේ කෙසේද? (ල.06)

iv. ප්‍රවෘත්ති පක්‍ෂග්‍රාහිත්වය යන්න වර්තමාන ජනමාධ්‍ය ඇසුරු කරගෙන කරුනු හතරක් ඔස්සේ විවරණය කරන්න. (ල.08)

**4)**

i. මාධ්‍ය සාක්ෂරතා **අධ්‍යාපනය** යන්න හඳුන්වන්න. (ල.02)

ii. පුද්ගලයෙකුගේ ඥාන ව්‍යුහ පුළුල් කර ගැනීම යනු කුමක්දැයි උදාහරණයක් ඇසුරෙන් දක්වන්න. (ල.04)

iii. **මාධ්‍ය හා තාක්‍ෂණය** යන්න ප්‍රභේද තුනක් ඔස්සේ පැහැදිලි කරන්න. (ල.06)

iv. විචාරශීලී ග්‍රාහකයා යන්න **ඩග්ලස් කෙල්නර්ට** අනුව නිර්වචනය කර විචාරශීලී ග්‍රාහකයා කෙරෙහි බලපාන සාධක හතරක් පැහැදිලි කරන්න. (ල.08)

Sanjeewa Krishantha Ranasinghe



"ඔබ නොකියවූ රොමෑන්ටික් කවිය"
සංජීව ක්‍රිෂාන්ත රණසිංහ

රොටරි - නුගේගොඩ / සියැස්රෝ - රත්නපුර / වික්ටරි - බලංගොඩ / සක්සස් - පැල්මඩුල්ල

**5)**

i. **සාක්ෂරතාවයට** අදාළ ක්ෂේත්‍ර හතරක් නම් කරන්න. (ල.02)
ii. උසස් මාධ්‍ය සාක්ෂරතාවක් ලබා ගැනීමේ ඇති **ප්‍රයෝජන** තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල.04)
iii. **මාධ්‍ය ආර්ථිකය** යන්න වර්තමාන උදාහරණ ඇසුරින් දක්වන්න. (ල.06)
iv. මාධ්‍ය සංදේශ විචාරයේදී විශ්ලේශණය ඉතා වැදගත් වන අතර එහිදී සලකා බැලෙන **කරුණු හතරක්** උදාහරණ ගෙන පැහැදිලි කරන්න. (ල.08)

**6)**

i. සාක්ෂරතාව පිළිබඳ **යුනෙස්කෝ** අර්ථකථනය කුමක්ද? (ල.02)
ii. පුද්ගලයෙකුගේ ස්වකේන්ද්‍රය **අවිඥානිකව** හා **විඥානිකව** ක්‍රියාත්මක වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.04)
iii. මාධ්‍ය විචාරයේ **දෘෂ්ඨිවාද** තුන හදුන්වා ඒවා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.06)
iv. විචාරශීලී ග්‍රාහකයා සතු කුසලතා හතරක් උදාහරණ සහිතව දක්වන්න. (ල.08)

**7)**

i. විචාරශීලී ග්‍රාහකත්වයේදී යොදා ගත හැකි විශ්ලේෂණ ප්‍රවේශ දෙක දක්වන්න. (ල.02)
ii. මාධ්‍ය සාක්ෂරතාවේ **සිද්ධාන්ත** තුන දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.04)
iii. සන්නිවේදන අරමුණු **හතරක්** නම් කර ඉන් **එකක්** සැකෙවින් පහදන්න(ල.06)
iv. තොරතුරු සම්පාදන කාර්යයේ වැදගත්කම පිළිබඳ කරුණු **හතරක්** පදනම් කරගෙන සගරාවකට ලිපියක් සකස් කරන්න. (ල.08)


070 31 98 591 / 077 45 17 280
070 31 98 591
Sanjeewa Krishantha Sanjeewa Krishantha


Sanjeewa Krishantha Ranasinghe